ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

12 (1)

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2021 - 03 - 03 |

පැමිණිලි පාර්ශවය : එච්.එම්.පී. නිරෝෂනි හේරත් මිය,
අංක : 348, බිහිරි සොරොව්ව,
මාවනාවෙල,
දෙහිඅත්තකණ්ඩිය.

වගඋත්තර පාර්ශවය : තැපැල්පති,
තැපැල් මූලස්ථානය,
කොළඹ.

<u>පැමිණිලි අංකය : **HRC/AM/03/18**</u>

ඉහත පැමිණිලි පාර්ශවයව විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කරමින් දන්වා සිටින්නේ, තමා දෙහිඅත්තකණ්ඩිය තැපැල් කාර්යාලයෙන් පාලනය වන සූරියපොකුණ උපතැපැල් කාර්යාලයේ 2007.06.29 දින සිට ලියාපදිංචි ආදේශිකාවක ලෙස සේවය කරමින් සිටියදී කුඩාපොළ උපතැපැල් කාර්යාලයේ උප තැපැල් ස්ථානාධිපති කේ.කේ.ජයවර්ධන මහතා අම්පාර ප්‍රාදේශිය තැපැල් අධිකාරිගේ දැනුම්දීම මත තමා කුඩාගල උපතැපැල් ස්ථානාධිපති තනතුරේ සේවය කිරීමට යෙදවූ බවයි.

එබැවින් තමාට වෙනත් රැකියාවකට යාමට තිබූ අවස්ථාවද අහිමි වූ බවත්, හිටපු උප තැපැල් ස්ථානාධිපතිගේ වංචනික ක්‍රියා හේතුවෙන් ආදායම් තත්ත්වය ඉතා පහළ මට්ටමක පැවති බවත්, කාර්යාලය දිරාපත්ව කඩා වැටීමෙන් ගසක් යට කුඩාරමක පවත්වාගෙන යාමට සිදුවූ බවත්, ඉතා දුෂ්කර වුවද උපතැපැල් කාර්යාලයේ ආදායම් තත්ත්වය ඉහළ නැංවීමට කටයුතු කළ බවත්, මෙසේ සේවය කරමින් සිටියදී 2014.07.15 වන දින කිසිදු හේතුවක් නොදන්වා තමා එම තනතුරෙන් ඉවත් කර හිටපු උප තැපැල් ස්ථානාධිපති කේ.කේ.ජයවර්ධන මහතාට එම තනතුර භාරදුන් බවත් පැමිණිල්ලෙන් සඳහන් කර ඇත.

මේ පිළිබඳව අදාළ සියළු ආයතන වෙත අභියාචනා කළ පසු එහි ප්‍රතිඵලයක් වශයෙන් තැපැල් අමාත්‍යාංශ ලේකම් විසින් 'වෙනත් කාර්යාලයක පුරප්පාඩුවකට යෙදවීමට හෝ කේ.කේ.ජයවර්ධන මහතා විශ්‍රාම




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

යනවිට එම පුරප්පාඩුවට තමා යෙදවීමට කටයුතු කරන ලෙස' තැපැල්පති වෙත දන්වා ඇති නමුත්, 2016.09.01 දින සිට කේ.කේ.ජයවර්ධන මහතාගේ දියණිය වන කේ.කේ.මංජුලා දමයන්ති මිය ලියාපදිංචි ආදේශිකාව ලෙස පත් කරගෙන ඇති බවත්, එබැවින් ඉදිරියේදී වැඩ බලන උප තැපැල් ස්ථානාධිපති තනතුර ඇයට ලබාදිය යුතු බව තැපැල්පතිවරයා විසින් තැපැල් අමාත්‍යංශය ලේකම් වෙත දන්වා ඇති අතර, මේ වනවිට එම තනතුර ඇයට ලබාදී ඇති බවත්ය.

එබැවින් තමා වෙනත් රැකියාවකටද නොගොස් මෙම රැකියාව පිළිබඳව තබා තිබූ විශ්වාසය කඩකිරීමෙන් තමන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවත්, එබැවින් සාධාරණයක් ඉටුකර දෙන ලෙසත් ඉල්ලා ඇත.

**වගඋත්තරකාර පාර්ශවයේ සැලකිරීම් :-**

වගඋත්තර පාර්ශවීය තැපැල්පති විසින් ඔහුගේ අංක : VE/APR/100/වැඩ/2008 සහ 2018.01.24 දිනැති වාර්තාව මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් දන්වා ඇත්තේ, කුඩාගල උපතැපැල් කාර්යාලයේ උප තැපැල් ස්ථානාධිපති කේ.කේ.ජයවර්ධන මහතා මුදල් වංචාවක් හේතුවෙන් වැඩ තහනම් කිරීම මත සූරියපොකුණ උප තැපැල් කාර්යාලයේ ලියාපදිංචි ආදේශිකාව වන පැමිණිලි පාර්ශවීය ප්‍රසංගිකා නිරෝෂනි මිය 2008.07.21 වන දින සිට කුඩාගල උප තැපැල් කාර්යාලයේ තාවකාලික උප තැපැල් ස්ථානාධිපති ලෙස පත් කළ බවත්, කේ.කේ.ජයවර්ධන මහතාගේ විනය පරීක්ෂණ කටයුතු අවසන්ව 2014.07.15 වන දින නැවත සේවයට පැමිණීමේදී එතෙක් තාවකාලික වැඩ බලන උප තැපැල් ස්ථානාධිපති ලෙස සේවය කළ ප්‍රසංගිකා නිරෝෂනි මිය සේවයෙන් මුදාහල බවත්, පසුව එය එම කාර්යාලයේ ලියාපදිංචි ආදේශකයෙකු නොසිටි බැවින් කේ.කේ.ජයවර්ධන මහතාගේ දියණිය වන කේ.කේ.මංජුලා දමයන්ති මිය 2016.04.01 දින සිට ලියාපදිංචි කළ බවත්, උපතැපැල් ස්ථානාධිපති තනතුරක් පුරප්පාඩු වනවිට එම කාර්යාලයේ සේවය කරන ලියාපදිංචි ආදේශක, වැඩ බලන උප තැපැල් ස්ථානාධිපති ලෙස පත් කරනු ලබන බැවින් කේ.කේ.ජයවර්ධන මහතා 2018.01.26 දින විශ්‍රාම යාමෙන් වන පුරප්පාඩුව සඳහා සුදුසුකම් සපුරා ඇති ලියාපදිංචි ආදේශිකා කේ.කේ.මංජුලා දමයන්ති මිය වැඩ බලන උප තැපැල් ස්ථානාධිපති ලෙස යෙදවීමට කටයුතු කරනු ලබන බවත් සඳහන් කර ඇත.

එබැවින් පැමිණිලි පාර්ශවීය එච්.එම්.පී.නිරෝෂනි හේරත් මිය කුඩාගල උප තැපැල් කාර්යාලයේ වැඩ බලන උප තැපැල් ස්ථානාධිපති ලෙස පත් කිරීමට මෙම අවස්ථාවේ හැකියාවක් නොමැති බවත්, ඉදිරියේදී ඇති වන පුරප්පාඩුවක් සඳහා ඇය යෙදවීමට හැකි බවත් සඳහන් කර ඇත.

නමුත් කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණයෙන් අනතුරුව කොමිෂන් සභාව විසින් 2018.05.21 දිනැතිව පැමිණිල්ලට අදාළ පූර්ණ වාර්තාවක් වගඋත්තර පාර්ශවීය තැපැල්පතිවරයා වෙත නිකුත් කරන ලද අතර,

ඉන් අනතුරුව තැපැල්පතිවරයා වෙනුවට නියෝජ්‍ය තැපැල්පති (පාලන) විසින් මෙම කොමිෂන් සභාව වෙත 2018.08.13 දිනැති වාර්තාව ඉදිරිපත් කරමින් දන්වා සිටින්නේ, පැමිණිලි පාර්ශවීය ප්‍රසංගිකා නිරෝෂනි හේරත් මියට කිසිදු අගතියක් සිදුවී නොමැති බවයි.

**පැමිණිල්ලේ විරෝධතා :-**

පැමිණිලි පාර්ශවය විසින් 2018.02.09 දාතමින් තැපැල්පතිගේ ඉහත වාර්තාවට විරෝධතා ඉදිරිපත් කරමින් දන්වා ඇත්තේ, තමාව වසර 06 කට අධික කාලයක් සේවයේ යොදවා 2014.07.15 වන දින සේවයෙන් ඉවත් කිරීම හේතුවෙන් තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ ගරු ලේකම් වෙත කරන ලද අභියාචනයෙන් අනතුරුව එතුමා විසින් තැපැල්පති වෙත දුන් නියෝගයට පටහැනිව කටයුතු කර තමාගේ විශ්වාසය, බලාපොරොත්තුව කඩ කරමින් තම මානව හිමිකම් උල්ලංඝනය කර ඇති බවයි. තැපැල්පතිතුමා වෙත කළ අභියාචනයට අනුව එතුමා විසින්, මඩකලපුව නියෝජ්‍ය තැපැල්පති මඟින් එය කරගත යුතු බවට උපදෙස් දී ඒ අනුව සටහන් යෙදූ බවත්, එය ඉදිරිපත් කළ පසු මඩකලපුව නියෝජ්‍ය තැපැල්පති විසින් ජ්‍යෙෂ්ඨතාවය මත තමාට එම තනතුර ලැබිය යුතු බව දන්වා සිටි බවත් සඳහන් කර ඇත. අම්පාර ප්‍රාදේශීය තැපැල් අධිකාරී වෙත තැපැල්පති විසින් සටහන යෙදූ ලිපිය ඉදිරිපත් කළ පසුව එතුමා ද ජ්‍යෙෂ්ඨතාවය මත එම තනතුර තමාට ලැබිය යුතු බවට සටහන් යෙදූ බවත්, දන්වා ඇත.

තමාට උප තැපැල් ස්ථානාධිපති තනතුර ලබාදෙන බවට මෙතෙක් තැබූ විශ්වාසය කඩ කිරීම පිළිබඳව තමාට සාධාරණයක් ඉටු කර දෙන ලෙසට පැමිණිල්ලෙන් ඉල්ලා ඇත.

ඉහත 2018.08.13 දිනැති වාර්තාව සඳහා පැමිණිලි පාර්ශවය 2018.08.24 දිනැතිව නැවත විරෝධතා කරුණු ඉදිරිපත් කර ඇත.

**පැමිණිල්ලේ පරීක්ෂණය :-**

2018.05.10 වන දින පවත්වන ලද පරීක්ෂණයේදී පැමිණිලි පාර්ශවය අනාවරණය කර සිටින ලද්දේ පැමිණිලි පාර්ශවය 2007 වර්ෂයේ සිට සූරිය පොකුණ උප තැපැල් කාර්යාලයේ ලියාපදිංචි ආදේශිකාවක ලෙස සේවය කරමින් සිටියදී 2008 වර්ෂයේ කුඩාගල උප තැපැල් ස්ථානාධිපති මුදල් වංචා හේතුවෙන් වැඩ තහනම් වීම මත එම පුරප්පාඩුව මත වැඩ බලන උප තැපැල් ස්ථානාධිපති ලෙස වසර 06 කට අධික කාලයක් සේවය කරමින් සිටියදී වැඩ තහනම් වූ ජයවර්ධන මහතා 2014 වර්ෂයේ නැවත සේවය ලැබීමෙන් පසු තමාව සේවයෙන් ඉවත් කළ බවත්, පසුව කේ.කේ.ජයවර්ධන මහතාගේ දියණිය වන කේ.කේ.මංජුලා දමයන්ති මිය ලියාපදිංචි ආදේශිකාවක ලෙස බඳවා ගත් බවත්ය. එසේම එය

නිත්‍යානුකූල ක්‍රමවේදයට සිදු නොකළ බවත්, තමන්ගේ අභියාචනය අනුව තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් දුන් නියෝගය ද නොතකා කේ.කේ.මංජුලා දමයන්ති මියට මේවනවිට කුඩාගල උප තැපැල් කාර්යාලයේ උපතැපැල් ස්ථානාධිපති තනතුර ලබාදී ඇති බවත් දක්වා ඇත.

තැපැල්පති නියෝජනය කරමින් පෙනීසිටි අම්පාර ප්‍රාදේශිය තැපැල් අධිකාරිවරයා පවසා ඇත්තේ, පැමිණිලි පාර්ශවයට අහතියක් සිදුවී ඇති බව පිළිගන්නා බවත්, මේවනවිට උප තැපැල් ස්ථානාධිපති තනතුර ගැසට් කර 2018.07.15 වන දින සම්මුඛ පරික්ෂණ පැවැත්වෙන බවත්ය. පැමිණිලි පාර්ශවය නියෝජනය කරමින් පෙනීසිටි විශ්‍රාමික තැපැල් ස්ථානාධිපති රත්නායක මහතා සඳහන් කර ඇත්තේ, එය පොදු ක්‍රමවේදයක් වන අතර, එම තැපැල් කාර්යාලයට පමණක් බඳවාගැනීමට පවතින එකක් නොවන බැවින්, එය පිළිනොගන්නා බවයි. ප්‍රාදේශිය තැපැල් අධිකාරි පවසා ඇත්තේ, පැමිණිලි පාර්ශවීය නිරෝෂනි හේරත් මියට වැඩි සේවා කාලයක් ඇති බැවින් ඇය එම තනතුර ලැබිය යුතු බවත්, එය තැපැල්පති පිළිගෙන ඇති බවත් ය. ඉදිරියේදී මෙම කොමිෂන් සභාව විසින් තීරණයක් ලබාදෙන ලෙස පාර්ශව ඉල්ලා ඇත.

**විමර්ශනයේදී අනාවරණය වූ කරුණු :-**

1. පැමිණිලි පාර්ශවීය එච්.එම්.පී.නිරෝෂනි හේරත් මහත්මිය 2007.06.29 වන දින සිට දෙහිඅත්තකණ්ඩිය සූරියපොකුණ උප තැපැල් කාර්යාලයේ ලියාපදිංචි ආදේශිකාවක ලෙස සේවය කරමින් සිටියදී කුඩාගල උප තැපැල් කාර්යාලයේ උප තැපැල් ස්ථානාධිපති මුදල් වංචා හේතුවෙන් වැඩ තහනමකට ලක්වූ පසු අම්පාර ප්‍රාදේශිය තැපැල් අධිකාරිගේ උපදෙස් පරිදි 2008.07.21 දින සිට කුඩාගල උප තැපැල් කාර්යාලයේ වැඩ බලන උප තැපැල් ස්ථානාධිපති ලෙස සේවය කර ඇති බව අනාවරණය වේ.

2. වැඩ තහනමකට ලක්වූ කේ.කේ.ජයවර්ධන මහතාගේ විනය පරික්ෂණ කටයුතු අවසන් වීමෙන් පසු 2014.07.15 වන දින නැවත සේවයට පැමිණ ඇති අතර, එදින සිට වැඩ බලන උප තැපැල් ස්ථානාධිපතිව සේවය කළ පැමිණිලිකාරියගේ සේවය අවසන් කර ඇති බව අනාවරණය වේ.

3. ලියාපදිංචි ආදේශකයෙකු බඳවා ගන්නා නිත්‍යානුකූල ක්‍රමවේදයෙන් බැහැරව 2016.04.01 වන දින කුඩාගල උප තැපැල් ස්ථානාධිපති කේ.කේ.ජයවර්ධන මහතාගේ දියණිය වන කේ.කේ.මංජුලා දමයන්ති මිය ලියාපදිංචි ආදේශකයෙකු ලෙස කුඩාගල උප තැපැල් කාර්යාලයට ලියාපදිංචි කර ඇති බව අනාවරණය වේ.

4. උප තැපැල් ස්ථානාධිපති කේ.කේ.ජයවර්ධන මහතා 2018.01.26 දින විශ්‍රාම යන අවස්ථාවේ වසර 06 කට අධික කාලයක් වැඩ බලන උප තැපැල් ස්ථානාධිපති තනතුරේ සේවය කළ පැමිණිලි පාර්ශවීය නිරෝෂනි හේරත් මිය උප තැපැල් ස්ථානාධිපති තනතුර ලැබීමට සුදුසුකම් ලබා තිබියදී ලියාපදිංචි අදේශක ලෙස මෑත කාලීනව බඳවාගත් කේ.කේ.මංජුලා දමයන්ති මියට උප තැපැල් ස්ථානාධිපති තනතුර ලබාදීම සඳහා තීරණය කර ඇති බවත්, මේවනවිට මංජුලා දමයන්ති මිය වෙත එම තනතුර ලබාදී ඇති බවත් අනාවරණය වේ.

5. පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කරන ලද පැමිණිල්ල විමර්ශනයේදී මෙකී පැමිණිලි පාර්ශවීය නිරෝෂා හේරත් මිය වෙත උප තැපැල් ස්ථානාධිපති තනතුර ලබාදීම නිත්‍යානුකූල බව වගඋත්තර පාර්ශවීය තැපැල්පතිවරයා විසින් පිළිගෙන ඇති බව 2018.05.10 වන දින මෙම කොමිෂන් සභාවේ පැවති විමර්ශනයේදී අනාවරණය වේ.

6. මේවනවිට උප තැපැල් ස්ථානාධිපති තනතුර සඳහා ගැසට් කර 2018.07.15 වන දින සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන බවත්, අම්පාර ප්‍රාදේශීය තැපැල් අධිකාරීගේ කරුණු දැක්වීම අනුව අනාවරණය වේ.

7. මෙම කොමිෂන් සභාව විසින් 2018.05.21 දිනැතිව වගඋත්තර පාර්ශවීය තැපැල්පතිවරයා වෙත යොමු කරන ලද වාර්තාව අනුව ඔහු වෙනුවෙන් උප තැපැල් අධිකාරී, උපතැපැල් කාර්යාලය විසින් 2018.06.20 දිනැති ලිපියෙන් අම්පාර ප්‍රාදේශීය තැපැල් අධිකාරී වෙත යොමු කරන ලද කරුණු විමසීම අනුව අම්පාර ප්‍රාදේශීය තැපැල් අධිකාරී විසින් 2018.07.04 දිනැති ලිපිය යොමු කරමින් මේ වනවිට කුඩාගල උප තැපැල් කාර්යාලයට සිදුකර ඇත්තේ, තාවකාලික වැඩ බලන පත්වීමක් බැවින් අසාධාරණයට ලක්වී සිටින පැමිණිලි පාර්ශවීය එච්.එම්.ප්‍රසංගිකා නිරෝෂනි මියට මෙම අවස්ථාවේ හෝ කුඩාගල උප තැපැල් ස්ථානාධිපති තනතුර ලබාදීම සුදුසු බව නිර්දේශ කර ඇති බව අනාවරණය වේ.

පැමිණිලිකාරිය දෙහිඅත්තකණ්ඩිය කුඩාගල උප තැපැල් කාර්යාලයේ වැඩ බලන තැපැල් ස්ථානාධිපති ලෙස කටයුතු කරමින් සිටියදී 2014.07.15 දින එම තනතුරෙන් ඉවත් කර ඒ සඳහා වැඩ තහනම්ව සිටි කේ.කේ.ජයවර්ධන මහතා පත් කොට ඇති අතර, ඔහු විශ්‍රාම යාමෙන් අනතුරුව පැමිණිලිකාරියට ලැබිය යුතුව තිබූ උප තැපැල් ස්ථානාධිපති තනතුර කේ.කේ.ජයවර්ධන යන විශ්‍රාම ගිය පුද්ගලයාගේ දියණියට ලබාදී ඇති අතර, පැමිණිලිකාරියගේ සුදුසුකම්, දීර්ඝ සේවා කාලය, ආදේශකයෙකු ලෙස සේවා කාලය නොසලකා කිසිදු සම්මුඛ පරීක්ෂණයකින් තොරව නීති විරෝධී ලෙස එම තනතුර කේ.කේ.ජයවර්ධන යන අය විශ්‍රාම ගැනීමෙන් අනතුරුව එම අයගේ දියණියට ප්‍රදානය කර ඇති බව අනාවරණය වේ. ඒ

තුළින් පැමිණිලිකාරියට අගතියක් සිදුවී ඇති අතර, එය 2018.05.10 දිනැතිව පරික්ෂණයේදී තැපැල්පති නියෝජිත අම්පාර ප්‍රදේශිය තැපැල් අධිකාරි විසින් පිළිගෙන ඇත. මේ තත්ත්වය තුළ පැමිණිලිකාරිය නීතිය ඉදිරියේ අසමනාතාවයට ලක් කොට ඇති බව අනාවරණය වේ.

**නිගමනය :-**

පැමිණිල්ලේ කරුණු හා විමර්ශන කරුණු අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 03 වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

පැමිණිලිකාරියට උප තැපැල් ස්ථානාධිපති තනතුරක් ලබාදීමට වගඋත්තර පාර්ශවය විසින් කටයුතු කළයුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2021.04.28 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රිත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දිම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වා සිටිමු.

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

B/R

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka